# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2021

2023 ඔක්තෝබර්

මානවශාස්ත්‍ර පීඨය

## බෞද්ධ මනෝවිද්‍යාව

**බෞද්ධ මනෝවිද්‍යාව හැඳින්වීම හා භාරතීය මනෝවිද්‍යාවෙහි දාර්ශනික පසුබිම BUPS – 18214**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

01. "මනෝවිද්‍යාව" යන්න නිර්වචනය කොට බෞද්ධ මනෝවිද්‍යාවේ ස්වභාවය සහ අරමුණු පැහැදිලි කරන්න.

02. මනස පිළිබඳ බෞද්ධ මනෝවිද්‍යාත්මක විවරණයෙහි අනන්‍යතාව හා විශේෂතා අනාවරණය කරන්න.

03. මානසික රෝග පිළිබඳ බෞද්ධ මනෝවිද්‍යාත්මක විවරණය කෙතෙක් දුරට නූතන මනෝරෝග වර්ගීකරණයන් හා සමවිසම වන්නේ දැයි පෙන්වා දෙන්න.

04. බෞද්ධ මනෝවිද්‍යාව තුළ සාර්ථක මනෝප්‍රතිකාර ක්‍රම අඩංගු වන බව මූලාශ්‍රයානුසාරයෙන් පැහැදිලි කරන්න.

05. භාරතීය ශ්‍රමණ සම්ප්‍රදායයන්හි අධිමානසික ශක්තීන් නියෝජනය වන අයුරු ප්‍රකට කරන්න.

06. වර්තමාන සමාජයේ බහුලව පවත්නා මානසික ගැටළු අවම කිරීමෙහි ලා බෞද්ධ මනෝවිද්‍යාව හා උපදේශනය ඇසුරින් යෝජනා කළ හැකි ක්‍රමවේද තුනක් (03) ගෙන හැර දක්වන්න.

07. සමකාලීන ආගමික දෘෂ්ටි බෞද්ධ ඉගැන්වීම් මගින් විවේචනය වී ඇති ආකාරය මූලාශ්‍රයානුසාරයෙන් විමසන්න.

08. පුද්ගලයාගේ කායික ශික්ෂණය ඇති කරගැනීමෙහි ලා බෞද්ධ විනය පිටකාගත ඉගැන්වීම් කෙතෙක්දුරට ඉවහල් වන්නේ දැයි පෙන්වා දෙන්න.

09. සාංඛ්‍ය දර්ශනය පිළිබඳ සැකෙවින් හඳුන්වා එහි අන්තර්ගත මනෝවිද්‍යාත්මක ප්‍රවණතා සාකච්ඡා කරන්න.

10. පහත දැක්වෙන මාතෘකා අතුරින් <u>දෙකකට (02)</u> ප්‍රමාණවත් සටහන් ලියන්න.

    i. ආත්මන්
    ii. බ්‍රහ්මන්
    iii. උපනිෂද් ආචාරධර්ම
    iv. සත් - අසත්

***********************************